// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2118/44 – 2019 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා – 2019.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 2019 අංක 05 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

දකුණු පළාත් සභාව විසින් 2019 මාර්තු මස 26 වැනි දින අනුමත කරන ලදුව දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2019 අප්‍රේල් මස 01 වැනි දින අනුමත කළ දකුණු පළාතේ 2019 අංක 05 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය ආණ්ඩුකාර අනුමැතිය ලද 2019 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන පිළිබඳ අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම මෙයින් දැනුම් දෙමි.

උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජල සම්පාදන හා ජලාපවාහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 01 වැනි දින,
4 මහල, දක්ෂිණපාය,
ලබුදූව, ගාල්ල
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A – PG4477 – 10 (2019/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 2019 අංක 05 දරන දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

දකුණු පළාතේ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහාත්, දකුණු පළාත තුළ සමුපකාර සමිතිවල සේවකයින් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහාත්, සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැළැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියයි.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1\. (1) මෙම ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2019 අංක 05 දරන දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ විධිවිධාන; මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා අනනුකූල වන්නේ නම් එම පනතේ විධිවිධාන දකුණු පළාත තුළ අවලම්භිතව හා අක්‍රියව තිබිය යුතු ය.

*අමාත්‍යවරයාට මෙම ප්‍රඥප්තිය අදාළ කර ගැනීමෙන් සමුපකාර සමිති නිදහස් කළ හැකි බව.*

2\. (1) අමාත්‍යවරයා, පළාත් කොමසාරිස්වරයා සහ කොමිෂන් සභාව විමසා *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයන් මගින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අදාළ කර ගැනීම;

(අ) එහි නියම කළ යුතු ඕනෑම සමුපකාර සමිතියක්; හෝ

(ආ) එසේ නියම කළ යුතු ඕනෑම සමුපකාර සමිති පන්තියක් නිදහස් කළ හැකිය.

## I වන කොටස

## දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම

*සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.*

3\. (1) දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව (මෙම ප්‍රඥප්තියේ කොමිෂන් සභාව ලෙස හඳුන්වන) ලෙස හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) කොමිෂන් සභාව (1) උපවගන්තියෙන් ඊට පැවරෙන නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එහි නාමයෙන් නඩු පැවරීමට ද, ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කළ හැකිය.

*සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය.*

4\. අමාත්‍යවරයා විසින්; 5 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතු අතර, එම සාමාජිකයින් වයස අවුරුදු 65 නොඉක්මවන අවම වශයෙන් වසර 10ක් වත් නීතිඥ වෘත්තියේ නියළුණු නීතිඥයින් විය යුතු ය.

*කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වීම සම්බන්ධයෙන් නුසුදුසුකම්.*

5\. කිසියම් පුද්ගලයෙකු සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙසට පත්කිරීමට හෝ පත්කරනු ලැබ සිටින්නේ නම් තව දුරටත් ධූරය දැරීමට පහත කරුණු නුසුදුසුකමක් වේ. ඔහු හෝ ඇය,

(අ) සමුපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු නම්;

(ආ) සමුපකාර සමිතිවල යම් සේවක ගණයක වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සැකසීම එහි අරමුණු හෝ අරමුණුවලින් එකක් ලෙස ඇති සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් පුද්ගල මණ්ඩලයක සාමාජිකයෙකු වේ නම්;

(ඇ) සමුපකාර සමිතියක නිලධාරියෙකු වන පුද්ගලයෙක් නම්;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වේ නම් හෝ, එවැන්නෙකු ලෙස පත්කරනු ලැබූ අයෙකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම්, හෝ එවැන්නකු වීම අවසන්වන අයෙකු නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ සිහිවිකල් බැව් තීරණය කළ හෝ ප්‍රකාශයට පත්කළ අයෙකු නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අපරාධ වරදක් සම්බන්ධව යම් අධිකරණයක් විසින් පනවන ලද සිරදඬුවමක් විඳ තිබූ අයෙකු නම්, හෝ විඳිමින් සිටින අයෙකු නම්;

(ඌ) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් ඍජුව හෝ වක්‍රාකාරව දරා සිටින අයෙකු නම්, හෝ භුක්ති විඳින අයෙකු නම්;

(එ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත්කරුවෙකු හෝ නිදහස් නොකළ බංකොලොත්කරුවෙකු ලෙස ප්‍රකාශ කර ඇති පුද්ගලයෙක් නම්;

(ඒ) කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස ඔහු සිය කාර්යයන් ඉටුකිරීමේ දී හානිකර ලෙස බලපෑ හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා තිබෙන අයෙකු නම්, හෝ;

(ඔ) කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණි අයෙකු වීම.

කොමිෂන් සභාවේ සභාපතිවරයා.

6. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙසත්, (මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් සාමාජිකයෙක් උපසභාපතිවරයා ලෙසත්, පත්කළ යුතුය.

(2) කොමිෂන් සභාවේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙළ කිරීම සහ මෙම ප්‍රඥප්තියේ මූලධර්ම සහ විධිවිධාන ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන ප්‍රතිපත්ති සහ නිර්දේශ කොමිෂන් සභාවට සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතු වන්නේය.

(3) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා එය පිළිගත් දින සිට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් 5 වන වගන්තියේ කරුණකට අදාළ වූ හේතු දක්වා සභාපතිවරයා සභාපති ධූරයෙන් ඉවත් කළ හැකිය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධූර කාලය, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතුය.

(6) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ කාර්යය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක සාමාජිකයෙකු ලෙස පත්කළ වෙනත් ඕනෑම පත්කළ සාමාජිකයෙකු ඔහුගේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව; සභාපතිවරයා ලෙස වැඩබැලීම සඳහා අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

කොමිෂන් සභාව එහි බලතල සභාපතිවරයාට පවරනු ලැබිය හැකි බව.

7. (1) කොමිෂන් සභාව විසින් එහි බලතල සහ කාර්යයන්ගෙන් කිසිවක් සභාපතිවරයාට පැවරිය හැකිය.

(2) එසේ පවරනු ලැබූ බලතල හා කාර්යයන් සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාන්‍ය හා විශේෂ නියමයන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

සාමාජිකයන්ගේ මූල්‍ය සම්බන්ධතා.

8. (1) යම් තැනැත්තෙකු කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට පෙර ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කාර්යයන් ඉටුකරනු ලැබීම කෙරෙහි හානිකර අන්දමින් බලපෑ හැකි මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඔහු සතුව නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්විය යුතුය.

(2) පත්කරනු ලැබූ දින සිට කොමිෂන් සභාවේ සාමාජිකයින් කිසිවෙක් එවැනි යම් සම්බන්ධතාවයක් අත්පත් කරගෙන නොමැති බවට ද, අමාත්‍යවරයා වරින්වර සෑහීමට පත්විය යුතුය.

(3) (අ) කොමිෂන් සභාව ඇතුළත් වන්නා වූ හෝ ඇතුළත් වීමට යෝජිත යම් කොන්ත්‍රාත්තුවක් සඳහා කෙළින්ම හෝ වක්‍රාකාරව හෝ යම් ආකාරයක සම්බන්ධතාවයක් ඇති කොමිෂන් සභාවේ කවර හෝ සාමාජිකයෙකු විසින් ඔහුගේ එම සම්බන්ධතාවයේ ස්වභාවය කොමිෂන් සභාවේ රැස්වීමක දී අනාවරණය කළ යුතුය; සහ

(ආ) එම අනාවරණය කිරීම කොමිෂන් සභාවේ රැස්වීම් වාර්තාවෙහි වාර්තා කළ යුතුය. තවද එම සාමාජිකයා කොමිෂන් සභාවේ එකී කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ සහභාගි නොවිය යුතුය.

සාමාජිකයන්ට අදාළ විධිවිධාන.

9. (1) අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් කොමිෂන් සභාවේ කවර හෝ සාමාජිකයෙකුට ඔහු දරන ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා එය පිළිගත් දින සිට එම ඉල්ලා අස්වීම ක්‍රියාත්මක විය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් 5 වන වගන්තියේ කරුණකට අදාළ වූ හේතු දක්වා කවර හෝ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) (අ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු මිය ගිය, ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් 4 සහ 5 වගන්තිවල විධිවිධාන සැළකිල්ලට ගනිමින් වෙනත් සාමාජිකයෙකු පුරප්පාඩු වූ ඔහුගේ ධුරයට පත්කරනු ලැබිය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් (අ) ඡේදයේ ඇතිවන පුරප්පාඩුවක් සඳහා හැකි ඉක්මනින් සාමාජිකයෙකු පත්කළ යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත්කළ සාමාජිකයෙකු ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙහි නොගෙවී ඉතිරි වී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

(5) කවර හෝ සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධුරයේ රාජකාරි ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධාන සැළකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැක.

(6) මෙම වගන්තිවල පූර්ව විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයෙකුගේ ධුර කාලය වසර තුනක් විය යුතු අතර, විනය හේතු මත ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස එම සාමාජිකයා නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

10. (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටිය හොත් උපසභාපතිවරයා එම රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) (අ) කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතු සියලු කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ රැස්වීමක දී ක්‍රියාකළ යුතු අතර පැමිණ ඡන්දය ලබාදෙන සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය.

(ආ) රැස්වීමකදී සලකා බලන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඡන්ද එක සමාන වූ විට රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(ඇ) හේතු මගින් සනාථ කළ සියලු තීරණ ලිඛිතව වාර්තා විය යුතු අතර, ඊට කොමිෂන් සභාවේ මුද්‍රාව තැබිය යුතුය.

(3) (අ) කොමිෂන් සභාවේ කුමන හෝ සාමාජිකයෙකුට රැස්වීමක් කැඳවන ලෙස සභාපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ හැකි අතර, සභාපතිවරයා සාධාරණ හේතු මත හැර එම ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

(ආ) 25 වන වගන්තිය යටතේ පත්කළ ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ සියලුම රැස්වීම් කැඳවිය යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතරේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසා හෝ එහි සාමාජිකයන් පත්කිරීමේ යම් දෝෂයක් වීම නිසා හෝ යන කරුණක් නිසාම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කර්තව්‍යයක් නිර්බල නොවන්නේය.

(5) කොමිෂන් සභාවේ ඕනෑම රැස්වීමක් සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සනපූර්ණ විය යුතුය.

(6) මෙම වගන්තියේ විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය සම්බන්ධ කාර්යය පටිපාටිවලට අදාළව නියෝග සැදිය හැකිය.

11. (1) කොමිෂන් සභාව එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමේ දී එයට සහාය වීම සඳහා එයට අවශ්‍ය යැයි සළකනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත කාරක සභා පිහිටුවිය හැකිය. කොමිෂන් සභාවේ කාරක සභා.

(2) කොමිෂන් සභාව එහි බලතල, කාර්යයන් හෝ රාජකාරි කිසිවක් කාරක සභාවකට පැවරිය හැකිය. එහෙත් කාරක සභාවකට පවරා තිබෙන යම් බලතල කාර්යය හෝ රාජකාරි පැවරීම ඉවත් නොකළ යුතුය.

(3) එම කාරක සභාවක් විසින් ගනු ලැබූ ඕනෑම තීරණයක් අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොමිෂන් සභාවට කළ හැකිය.

12. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් තීරණය කළ පරිදි විය යුතුය. මුද්‍රාව.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව;

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සකස් කර ගත හැකිය.

(ආ) කොමිෂන් සභාව නිශ්චය කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයන් භාරයේ තිබිය යුතුය; සහ

(ඇ) කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව සහ කොමිෂන් සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතුය. තමන් පැමිණ සිටි බවට ඒ සාමාජිකයින් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් කළ යුතුය.

(3) කොමිෂන් සභාව, කොමිෂන් සභාවේ මුද්‍රාව තැබූ ලේඛන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

13. කොමිෂන් සභාවේ සභාපතිවරයාට; උපසභාපතිවරයාට සහ අනෙක් සාමාජිකයාට අමාත්‍යවරයා විසින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත හා මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයෙන් පාරිශ්‍රමික ගෙවිය යුතුය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

14. (1) කොමිෂන් සභාවේ සාමාජිකයින් ඔවුන් මුල්වරට පත්කරනු ලබන අවස්ථාවේ දී මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ දක්වා ඇති ආකාරයෙන් දිවුරුම් දිය යුතුය. කොමිෂන් සභා සාමාජිකයින්ගේ හා නිලධාරින්ගේ දිවුරුම.

(2) කොමිෂන් සභාවේ ලේකම් ද ඇතුළුව සභාපතිවරයා විසින් එසේ කිරීමට නියම කරනු ලබන කොමිෂන් සභාවේ අනෙකුත් නිලධාරින් ද ඔවුන් මුල්වරට පත්කරනු ලබන අවස්ථාවේ දී දිවුරුම් දිය යුතුය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

කොමිෂන් සභාවේ බලතල.

15. (1) කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) සමුපකාර සමිතියක සේවකයින් බඳවාගැනීමේ ක්‍රම, ඔවුන් සේවයේ යෙදවීම පිළිබඳ නියම සහ කොන්දේසි සහ සේවකයින් පත් කිරීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම සහ එකම සමුපකාර සමිතියේ එක් තනතුරක සිට වෙනත් තනතුරකට උසස්වීම් කිරීමේ දී එම සමුපකාර සමිති විසින් අනුගමනය කළ යුතු මූලධර්ම සම්බන්ධයෙන් සියලු කරුණු නිශ්චය කිරීම.

(ආ) සමුපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම හෝ එම විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කිරීම සහ විභාග සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය කිරීම.

(ඇ) සමුපකාර සමිතියක ඕනෑම තනතුරකට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, ඕනෑම පන්තියක් හෝ ශ්‍රේණියක් හෝ එවැනි යම් තනතුරක් සඳහා වැටුප් පරිමාණ නියම කිරීම, පළාත් කොමසාරිස්වරයා විමසා වරින් වර එම වැටුප් පරිමාණ සංශෝධනය කිරීම හෝ ගැලපීම.

(ඈ) සමුපකාර සේවකයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි නිශ්චය කිරීමේ දී එයට සහාය දැක්වීම සඳහා කොමිෂන් සභාව අවශ්‍ය යැයි සලකන උපදේශන යාන්ත්‍රණ පිහිටුවීම.

(ඉ) ඕනෑම පන්තියක හෝ ශ්‍රේණියක තනතුරකට හෝ තනතුරුවලට කොමිෂන් සභාව නියම කරන වැටුප් පරිමාණ අනුව වැටුප් ගෙවීමට සමුපකාර සමිතිවලට නියෝග කිරීම.

(ඊ) එහි සේවකයන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීමට ඊට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී සමුපකාර සමිති විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි නිශ්චය කිරීම, එහි සේවකයන්ට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කිරීමට ඕනෑම සමුපකාර සමිතියකට නියම කිරීම, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් තුළ එම පරීක්ෂණ සම්පූර්ණ කිරීම සහ යම් විනයානුකූල නියෝගයකින් පැන නගින අභියාචනා විභාග කිරීම.

(උ) නියම කරනු ලබන ආකෘතිවලට අනුකූලව එම සමිතියේ සේවකයන්ට අදාළව ලේඛන සහ වාර්තා තබා ගැනීමට සහ පවත්වා ගෙන යාමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(ඌ) එම සමිතියේ යම් සේවකයකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියම කරනු ලැබිය හැකි නියමිත වාර්තා ගොනු, අනෙකුත් ලේඛන හෝ තොරතුරු නියමිත දිනයකට පෙර ඉදිරිපත් කිරීමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(එ) කොමිෂන් සභාවට; ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කොමිෂන් සභාව විසින් එම මණ්ඩලයට හෝ මණ්ඩලවලට යොමු කරනු ලැබිය හැකි අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ කිරීම සඳහා නිලධාරි මණ්ඩලයක් හෝ මණ්ඩල පත් කිරීම.

(ඒ) සේවකයාගේ හැසිරීම පරීක්ෂණයකට විෂය වී තිබෙන සහ ඊට අදාළව සමිතියේ තීරණයට එරෙහිව කොමිෂන් සභාවට සේවකයා අභියාචනා කර තිබෙන අවස්ථාවක එම සමිතියේ එම සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නැවත සේවයේ පිහිටුවීමට අදාළව දෙනු ලබන උපදෙස් ඇතුළු උපදෙස් ඉටු කිරීමට යම් සමුපකාර සමිතියකට නියම කිරීම.

(ඔ) ඔවුන්ගේ සේවා අවසන් කිරීම සම්බන්ධයෙන් සේවකයින්ට දෙනු ලැබිය හැකි පාරිතෝෂිකය හෝ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් සාමාන්‍ය මූලධර්ම නිශ්චය කිරීම.

(ඕ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් එම සමුපකාර සමිතියක් හෝ සමුපකාර සමිති පන්තියක් නිදහස් කිරීමට අදාළව පළාත් කොමසාරිස්වරයා විමසා අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

(ක) කොමිෂන් සභාවට අවශ්‍ය යැයි සලකන නියෝග යම් සමුපකාර සමිතියකට හෝ එම සමුපකාර සමිතියේ සේවකයකුට හෝ ලබාදීම; සහ

(ග) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතේ කරනු ලබන සමුපකාර සේවකයකුගේ මාරු කිරීමට එරෙහිව කොමිෂන් සභාවට කරනු ලබන අභියාචනයක් ඇසීමෙන් පසුව කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ඉටු කිරීමට යම් අදාළ සමුපකාර සමිතියකට නියම කිරීම.

(2) (1) වන උප වගන්තියෙන් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව විසින් කරන ලද තීරණයක් හෝ නිශ්චය කිරීමක් කොමිෂන් සභාවට, වෙනස් කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ අවහරණය කිරීම කළ හැකිය.

## III වන කොටස

### සමුපකාර සමිති හා ඒවායේ සේවකයෝ

16. (1) සෑම සමුපකාර සමිතියක්ම හා එම සමිතියක යම් සේවකයෙක් 15 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියමවලට එකඟ විය යුතුය. — *සමුපකාර සමිති සහ ඒවායේ සේවකයින් කොමිෂන් සභාවේ නියමවලට යටත් විය යුතු බව.*

(2) කොමිෂන් සභාවේ පරීක්ෂණයක් හෝ නිල අවශ්‍යතාවයක් ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වන සමුපකාර සමිතියක සේවකයෙකු කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

17. මෙම ප්‍රඥප්තිය යටතේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාවේ සෑම තීරණයක්ම සහ නියමයක්ම සියලු සමුපකාර සමිති හෝ එම සමිතිවල යම් සේවකයෙක් සම්බන්ධයෙන් අනුගම්‍ය විය යුතුය. — *සමුපකාර සමිතිවල සේවකයින් කොමිෂන් සභාවේ විධානවලින් බැඳුනු බව.*

18. සියලු සමුපකාර සමිති එම සමිතියේ සේවකයින්ට වැටුප් හා වෙනත් දීමනා එම සමිතියේ අරමුදලින් ගෙවිය යුතුය. — *සමුපකාර සමිතිවල සේවකයින්ගේ වැටුප.*

19. (1) යම් සමුපකාර සමිතියක් එම සමිතියේ යම් සේවකයෙක් එහි යම් එක් සේවා ස්ථානයක සිට එහි වෙනත් යම් සේවා ස්ථානයකට මාරු කළ හැකි අතර, විනයානුකූල හේතු මත හැර යම් වෙනත් හේතූන් නිසා මාරු කළ අවස්ථාවක එවැනි යම් සේවකයෙකුගේ සංචේතනවලට එම මාරු කිරීම අහිතකර ලෙස බලනොපැවැත්විය යුතුය. — *සමුපකාර සමිතිවල සේවකයින් ස්ථාන මාරු කිරීම.*

(2) අදාළ සේවායෝජකයන්ගේ එකඟතාවය කලින් ලබාගෙන ඇත්නම්, සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ හවුල් ඉල්ලීමක් අනුව යම් සමුපකාර සමිතියක සේවයෙන් වෙනත් සමුපකාර සමිතියකට පසුව සඳහන් කළ සමිතියේ සේවකයෙක් ලෙස මාරු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත.

20. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් රෙගුලාසියක් හෝ රීතියක් අනුව මිස සමුපකාර සමිතියක් විසින් එම සමුපකාර සමිතියේ යම් සේවකයෙකු අස්කිරීම හෝ අන්‍යාකාරයෙන් දඬුවම් කිරීම නොකළ යුතුය. — *සමුපකාර සමිතිවල සේවකයින් අස්කිරීම හා දඬුවම් කිරීම.*

(2) යම් සමුපකාර සමිතියක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට කලින් ක්‍රියාත්මක වූ විධිවිධාන අනුව යම් විෂමාචාරයක් හෝ විනය කඩකිරීමක් හෝ එදිනට පෙර සිදු කළ හෝ පැන නැගුන යම් පැමිණිල්ලක යම් හේතුවක් සම්බන්ධයෙන් එහි සේවකයන්ගෙන් යමෙකුට එරෙහිව දැනටමත් නොවිසඳී පවතින යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සම්පූර්ණ කිරීම මෙම වගන්තියේ පූර්ව විධිවිධාන කිසිවක් විසින් නීත්‍යානුකූල නොවන්නේ යැයි සැලකිය යුතු නොවන්නේය.

සමුපකාර සමිතිවල සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ඇප.

21. (1) අමාත්‍යවරයා රෙගුලාසි මගින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන මුදලක් ඇප ආකාරයෙන් ඉදිරිපත් කිරීමට යම් සේවකයෙකුට නියම කිරීම සමුපකාර සමිතියක් නොකළ යුතුය.

(2) (1) වන උප වගන්තියට යටතේ ඉදිරිපත් කර ඇති යම් ඇප මුදලක් සමිතියේ නමින් රාජ්‍ය බැංකුවක ආයෝජනය කිරීම සමුපකාර සමිතියක් කළ යුතු වන අතර, ඒ මත උපචිත වන පොළිය සේවකයාට ගෙවිය යුතුය.

සේවකයින් සම්බන්ධයෙන් සමුපකාර සමිතිවල රාජකාරි.

22. (1) සෑම සමුපකාර සමිතියක්ම;

(අ) එහි සේවකයින් සම්බන්ධයෙන් නියමිත ලේඛන සහ වාර්තා තබා ගැනීම හා පවත්වාගෙන යාම.

(ආ) එහි සේවකයින්ට අදාළව නියමු කරනු ලැබිය හැකි වාර්තා හෝ වරින් වර කොමිෂන් සභාව නියම කරනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීම; සහ

(ඇ) එහි යම් කාර්යාලයකට ඇතුලුවීමට සහ එහි තබා ඇති යම් පොත්, ගිණුම්, වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට සහ පිටපත් ගැනීමට, ඒ සම්බන්ධයෙන් බලය දී ඇති කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට හෝ සේවකයෙකුට අවසර දීම සෑම සමුපකාර සමිතියක්ම කළ යුතුය.

අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිභාර අරමුදල

23. සියලු සමුපකාර සමිති හා එම සමිතිවල සියලු සේවකයින් යම් ලිඛිත නීතියකින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණවලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලට කලින් කල දායක විය යුතුය.

කොන්ත්‍රාත් පදනමින් අනියම් පදනමින් හා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් යෙදවීම.

24. යම් සමුපකාර සමිතියක් එහි කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය පිණිස;

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව සමුපකාර සමිතිය නිශ්චය කළ හැකි නියම සහ කොන්දේසි මත; කොන්ත්‍රාත් පදනමින් විශේෂඥවරයෙකුගේ හෝ ප්‍රවීණයෙකුගේ සේවය ලබා ගැනීම; හෝ

(ආ) අනියම් හෝ දෛනික වැටුප් ගෙවීම් කරන සේවකයින් හෝ කෑලි පදනම මත ගෙවීම් කරන සේවකයින් සේවයේ යෙදවීම කළ හැකිය.

කෙසේ වෙතත් කොමිෂන් සභාවේ එකඟතාවයකින් තොරව දින 30 ඉක්මවා කාල පරිච්ඡේදයක් සඳහා එවැනි සේවකයින් යෙදවීම නොකළ යුතුය.

## IV වන කොටස

### කොමිෂන් සභාවේ ලේකම් සහ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ලේකම්වරයා.

25. කොමිෂන් සභාවේ ලේකම්වරයෙක් සිටිය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් විය යුතුය.

## V වන කොටස

## මුදල්

26. කොමිෂන් සභාවේ වියදම් දකුණු පළාත් සභාවේ වාර්ෂික මුදල් ඇස්තමේන්තුවෙන් කාර්යයන් සඳහා ලබාදෙන මුදල්වලින් ගෙවිය යුතු වන්නේය. මූල්‍ය විධිවිධාන.

27. කොමිෂන් සභාව සුදුසු යැයි සළකන යම් බැංකුවක යම් ගිණුමක් ආරම්භකොට පවත්වා ගෙන යා හැකි අතර, එම ගිණුම්; පළාත් සභා මූල්‍ය ගණුදෙනුවලට අදාළව පවතින පළාත් සභා මූල්‍ය රෙගුලාසි අනුව ක්‍රියාත්මක කළ යුතු වන්නේය. කොමිෂන් සභාව ගිණුම් පවත්වාගෙන යා යුතු බව.

28. (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුත්තේය. මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) කොමිෂන් සභාවේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්වීම කොමිෂන් සභාව කළ යුතු වන්නේය.

(3) කොමිෂන් සභාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව පළාත් සභා මූල්‍ය රීති අනුව ගිණුම් පිළියෙල කළ යුතුය.

(4) පළාත් සභා මුදල් රීති අනුව ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු වන්නේය.

29. පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව කොමිෂන් සභාවට අයත් මුදල් ආණ්ඩුව අනුමත කළ සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකිය. අරමුදල් ආයෝජනය කිරීම.

30. (1) අමාත්‍යවරයාගේ සහ මුදල් විෂය පවරා ඇති පළාත් අමාත්‍යවරයාගේ ලිඛිත එකඟතාවය ඇතිව සහ දෙන ලද යම් පොදු අධිකාරි බලයක නියමයන්ට අනුව කොමිෂන් සභාවේ යම් බැඳීම් පියවීම සඳහා අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීමට හෝ ණය කොන්දේසි මත ලබා ගැනීමට කොමිෂන් සභාවට හැකිය. ණය ලබා ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල.

(2) මෙම වගන්තිය යටතේ, කොමිෂන් සභාව රැස් කර ගන්නා ලද යම් ණය මුදල් සම්බන්ධයෙන් යම් අවස්ථාවක හිඟව පවත්නා මුළු මුදල අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල නොඉක්මවිය යුතුය.

## VI වන කොටස

## පොදු විධිවිධාන

31. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවට එහි බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් ලිඛිතව සාමාන්‍ය හා විශේෂ නියෝග වරින්වර නිකුත් කරනු ලැබිය හැකි අතර, එම නියෝග ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාවේ රාජකාරිය විය යුතුය. අමාත්‍යවරයාට නියෝග සැදිය හැකි බව.

(2) කොමිෂන් සභාවේ වැඩවලට අදාළ වාර්තා, ගිණුම් හෝ යම් වෙනත් තොරතුරු ඔහු නියම කරනු ලබන ආකෘතිවලින් ඔහු වෙත ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, එම නියෝග ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාවේ රාජකාරී විය යුතුය.

කොමිෂන් සභාව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.

32. (1) කොමිෂන් සභාව එක් මුදල් වර්ෂයක් අවසන් වී මාස 06ක් ඇතුළත එම මුදල් වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් කරගෙන ගිය ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු අතර, එම වර්ෂයට අදාළ පහත දැක්වෙන ලේඛනවල එක් පිටපත බැගින් එම වාර්තාවට අමුණනු ලැබීමට සැලැස්විය යුතුය.

(අ) වර්ෂය සඳහා කොමිෂන් සභාවේ විගණනය කළ ගිණුම්;

(ආ) එම වාර්තා සහ ගිණුම් අදාළ වන වර්ෂයට පසුවට එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක්.

(2) (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තා සහ ලේඛනවල පිටපත් එම වාර්තා ලැබුණු දින සිට මාස 06 ක් ඇතුළත අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

රහස්‍යභාවය.

33. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙක්ම, නිලධාරියෙක්ම, සේවකයෙක්ම සිය රාජකාරි ආරම්භ කිරීමට පෙර මෙම ප්‍රඥප්තිය යටතේ සිය බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ඔහු දැනගත් කොමිෂන් සභාවේ සියලු කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීමට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, එම ප්‍රකාශය මගින් පහත සඳහන් දේ හැර වෙනත් කරුණු අනාවරණය නොකරන බවට පොරොන්දු විය යුතුය.

(අ) එසේ කිරීමට අධිකරණයකින් නියම කරන ලද විට; හෝ

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකිරීමේ කාර්යය සඳහා.

කොමිෂන් සභාවේ බලතල පැවරීම.

34. (1) කොමිෂන් සභාව ලිඛිතව සහ එහි නියම කර ඇති කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාවේ යම් නිලධාරියෙකුට එහි බලතල කාර්යය සහ රාජකාරිවලින් කිසිවක් පැවරිය හැකි අතර, එවැනි යම් නිලධාරියෙක් එම බලතල කාර්යය සහා රාජකාරි කොමිෂන් සභාවේ නමින් සහ කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු වන්නේය.

(2) (1) වන උපවගන්තිය යටතේ, යම් බලතල පවරා තිබුණ ද කොමිෂන් සභාව, එසේ පවරන ලද යම් බලතල, කාර්යය හෝ රාජකාරි ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ හැකි අතර, ඕනෑම අවස්ථාවක එම බලතල අවලංගු කළ හැකිය.

කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් රජයේ නිලධාරීන් ලෙස සැලකිය යුතුබව.

35. කොමිෂන් සභාවේ ලේකම් ඇතුලු සියලුම නිලධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ ඒ කාර්යය සඳහා රාජ්‍ය නිලධාරීන් ලෙස සැලකිය යුතුය.

කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතුබව.

36. කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව සහ කාර්යයන් සඳහා උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතුවන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතුය.

රෙගුලාසි

37. (1) මෙම ප්‍රඥප්තියෙන් රෙගුලාසි සෑදීමට නියමිත යම් කරුණු සම්බන්ධයෙන් හෝ ඒ සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීම සඳහා මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රෙගුලාසි සෑදිය හැකිය.

(2) (1) වන උප වගන්තියෙන් පවරා ඇති බලතලවල පොදු බවට අගතියක් නොවන පරිදි ද, අමාත්‍යවරයාට කොමිෂන් සභාව විමසා පහත සඳහන් සියලු කරුණු හෝ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රෙගුලාසි සෑදිය හැකිය.

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ අයකළ යුතු ගාස්තු;

(ආ) 15 (උ) වගන්තිය යටතේ පවත්වාගෙන යා යුතු සමුපකාර සමිතියක සේවකයන් සම්බන්ධයෙන් වන ලේඛන සහ වාර්තා;

(ඇ) සමුපකාර සමිතියක යම් තනතුරකට පත්කරනු ලැබීම සඳහා පවත්වාගෙන යනු ලැබීමට නියම කර ඇති පදිංචිය පිළිබඳ සුදුසුකම්;

(ඈ) සමුපකාර සමිතියක සේවකයෙකු විසින් ඉදිරිපත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණ;

(ඉ) සමුපකාර සමිතියක සේවකයෙකු ලෙස බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම;

(ඊ) සමුපකාර සමිතියක් සේවකයන්ගේ බඳවා ගැනීම් පටිපාටි, පත්වීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවා අවසන් කිරීම්;

(උ) එම සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි සහ වැටුප් පරිමාණ, දීමනා හා පාරිතෝෂිත ගෙවීම, අත්තිකාරම්, උසස්වීම්, නිවාඩු ලබා දීම, සේවකයන්ගේ වැඩ තහනම් කිරීම, සේවයෙන් පහ කිරීම හෝ එම සේවකයන්ට වෙනත් යම් ආකාරයක දඬුවම් පැමිණවීම සහ ඒ හා සම්බන්ධ අභියාචනා;

(ඌ) අවශ්‍ය යැයි සලකන සේවකයින්ගේ සේවා නියම හෝ කොන්දේසිවලට අදාළ වෙනත් කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කළ දින සිට හෝ නියම කරනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(4) (අ) අමාත්‍යවරයා, විසින් සකස් කරන ලද සියලුම රෙගුලාසි ඒවා ගැසට් පත්‍රයේ පළ කර මාස 6ක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වන්නේය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් රෙගුලාසියක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි එසේ අනුමත නොකළ දින සිට අවලංගු කළ ලෙස සැළකිය යුතුය.

(5) එසේ අමාත්‍යවරයා විසින් සාදන යම් රෙගුලාසියක් එසේ අවලංගු වූවා සේ සලකන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන්නේය.

38. (1) පහත සඳහන් කරුණු සියල්ල හෝ යම් එක් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට රීති සෑදිය හැකිය. රීති සෑදීමට කොමිෂන් සභාවට ඇති බලය.

(අ) මෙම ප්‍රඥප්තියේ යම් වෙනත් විධිවිධානයක් යටතේ රීති සෑදීමට කොමිෂන් සභාවට නියම කරන ලද හෝ බලය පවරන ලද කරුණු සම්බන්ධයෙන්,

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම් සහ එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි; සහ

(ඇ) කොමිෂන් සභාවේ කටයුතුවලට අදාළ යම් වෙනත් කරුණක් සම්බන්ධයෙන්.

(2) කොමිෂන් සභාව විසින් සාදන ලද සියලු රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

39. (1) යම් සමුපකාර සමිතියක් හෝ එහි සේවකයෙක්; වැරදි හා දඬුවම්.

(අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝණය කරයි නම්; හෝ,

(ආ) කරනු ලැබීමට කොමිෂන් සභාවවිසින් නියම කරනු ලබන යම් ක්‍රියාවක් කිරීම හෝ කොමිෂන් සභාව හෝ වෙනත් නිසි බලය ඇති පුද්ගලයෙකු විසින් ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා නියම කරන යම් තොරතුරු ඉදිරිපත් කිරීම හිතාමතාම පැහැර හරියි නම් හෝ ප්‍රතික්ෂේප කරයි නම් හෝ කිරීමට අපොහොසත් වන්නේ නම්;

(ඇ) හිතාමතාම අසත්‍ය වාර්තා හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්නේ නම්;

(ඈ) යම් සාධාරණ හෝ නීත්‍යානුකූල පදනමකින් තොරව මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක් යටතේ සිය බලතල ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකරන යම් පුද්ගලයෙකුට බාධා කරන්නේ නම්;

(ඉ) මෙම ප්‍රඥප්තියේ අධිකාරී බලය යටතේ ක්‍රියාකරමින් මෙම ප්‍රඥප්තිය යටතේ බලතල කාර්යයන් හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරන හෝ ඉටුකරන අතරතුර, පීඩාකාරී හෝ ප්‍රකෝපකාරී ආකාරයෙන් හැසිරෙන්නේ නම්;

(ඊ) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක යම් විධිවිධාන කිසිවක් කඩ කරන්නේ නම් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුට දෙන ලද යම් නියමවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එම සමුපකාර සමිතිය හෝ එම සේවකයන් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලබන්නේය.

(2) (1) වන උප වගන්තිය යටතේ යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක්, හෝ සේවකයෙක්, මහෙස්ත්‍රාත්වරයෙකු විසින් වැරදිකරුවෙකු කරනු ලැබූ විට, රුපියල් විසිදහසකට නොවැඩි දඩයක් හෝ මාස හයක් නොඉක්මවන සිරදඬුවමකට හෝ දඩය සහ සිරදඬුවම යන දෙකටම යටත් වන්නේය.

(3) සමුපකාර සමිතියක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක එම වරද කරන බව ඔහු නොදැන සිටි බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමට නිසි සියලු දේ ක්‍රියාත්මක කළ බව හෝ ඔහු ඔප්පු නොකළහොත් එම සමිතියේ සියලු නිලධාරීන් එම වරදට වැරදිකරු ලෙස සැළකිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවීමට නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන යම් නියමයන් ඉටුකිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් යම් සමුපකාර සමිතියක් වැරදිකරු කරනු ලැබූ විට එම සමුපකාර සමිතිය;

(අ) (2) වන උපවගන්තිය යටතේ එම සමුපකාර සමිතියට නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව එසේ වැරදිකරු කරනු ලැබීමෙන් පසු එම අපොහොසත් වීම අඛණ්ඩව පැවති එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩයක් ගෙවීම; සහ

(ආ) ඒ එක් එක් දවසෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවා ගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වූ කාල පරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ සිටියේ නම්, ඔහුගේ සේවය අවසන් කරනු නොලැබ තිබිණි නම් ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය එම සේවකයාට ගෙවීමට එම සමුපකාර සමිතිය බැඳී සිටී.

මෙම උප වගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවීමට සමුපකාර සමිතිය බැඳී ඇති යම් මුදලක් එම සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් එයට පනවන දඩයක් ලෙස අධිකරණයේ නියෝගයක් මගින් අය කර ගනු ලැබිය හැකි අතර, එසේ අය කරගත් මුදල සේවකයාට ගෙවිය යුතුය.

40. සිය රාජකාරි ඉටු කිරීමේ දී හැර කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයෙකුගේ යම් තීරණයකට සෘජුව හෝ වක්‍රව හෝ ඔහු විසින්ම හෝ යම් පුද්ගලයෙකු මගින් හෝ කුමනාකාරයකින් හෝ බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම වරදකට වරදකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වැරදිකරු කරනු ලැබූ විට ඔහු රුපියල් විසිදහසකට නොවැඩි දඩයක් හා මාස හයක් නොඉක්මවන සිරදඬුවමකට හෝ දඩය හා සිරදඬුවම යන දෙකටම යටත් වන්නේය.

කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත් වීම.

41. කොමිෂන් සභාවේ කිසිදු සාමාජිකයෙකු, කොමිෂන් සභාවේ ලේකම්, කොමිෂන් සභා කාර්යය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු, හෝ අන් කවර තැනැත්තෙකු විසින් වුවද, තම නිල කාර්යයන් කිරීමෙහි ලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටු කිරීමේ දී තමාට දැන ගන්නට ලැබුණු කවර හෝ ලේඛනයක් සංදේශයක් හෝ තොරතුරක් පළකිරීම හෝ අන් තැනැත්තෙකුට එළිරදව් කිරීම නොකළ යුතුය.

බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව.

42. (1) 1998 අංක 01 දරන දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය මෙයින් අවලංගු කෙරේ.

අවලංගු කිරීම් හා ඉතිරි කිරීම්.

(2) ඉහත කී ප්‍රඥප්තිය අවලංගු කිරීම නොසළකා,

(අ) අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ සාදන සහ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නතම කලින් දින සිට බලාත්මකව පවතින සියලුම රෙගුලාසි, දැන්වීම්, නියෝග, රීති හෝ මාර්ගෝපදේශ හෝ නිකුත් කරන ලද නියම, පනවන ලද අවශ්‍යතා නිශ්චය කිරීම් හෝ පැවරීම් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි නිකුත් කරන ලද හෝ පනවන ලද හෝ සාදන ලද රෙගුලාසි, දැන්වීම්, නියෝග, රීති, මාර්ගෝපදේශ, නියම, අවශ්‍යතා නිශ්චය කිරීම් හෝ පැවරීම් ලෙස සැලකිය යුතුය.

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට ආසන්නතම කලින් දිනට, අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාවට අයත් සියලු චංචල හා නිශ්චල දේපළ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත පැවරෙන අතර, එහි දේපළ ලෙස සැලකිය යුතුය.

(ඇ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට අවසන් නොවූ සහ අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පවරා ඇති යම් නඩුවක්, පැමිණිල්ලක්, නීති කෘත්‍යයක්, කරුණක් හෝ දෙයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිට වූ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පනවා ඇති නඩුවක්, පැමිණිල්ලක්, නීති කෘත්‍යයක්, කරුණක් හෝ දෙයක් ලෙස සැලකිය යුතු අතර, එම අධිකරණය විසින් ඇසිය යුතු වන්නේය.

(ඈ) යම් නඩුවක්, කරුණක්, නීති කෘත්‍යයක්, හෝ දෙයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාවට පක්ෂව හෝ එරෙහිව කරන ලද, සටහන් කරන ලද, යම් තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ තීරණයක් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව වෙනුවෙන් හෝ එරෙහිව සටහන් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ තීරණයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කළ යුතුය.

(ඉ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නම කලින් දිනට එකී ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලයේ සියලු නිලධාරීන් සහ සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සහ සේවකයන් ලෙස සැලකිය යුතුය; සහ

(ඊ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට ආසන්නම කලින් දිනට අවලංගු කරන ලද ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව සමග හා වෙනුවෙන් ඇතිකරගත් සියලු ණය, බැඳීම්, වත්කම් සහ වගකීම් ක්‍රියාත්මක කරන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් යෙදී ඇති සියලු කරුණු හෝ කරනු ලැබීමට එකඟ වී ඇති දේවල් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව සමග සහ වෙනුවෙන් ඇතිකර ගත් ණය, බැඳීම්, වත්කම් හා වගකීම් ක්‍රියාත්මක කරන ලද හෝ බලාත්මක කරන ලද සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම් යෙදී ඇති සියලු කරුණු හෝ දේවල් හෝ කරනු ලැබීමට එකඟ වී ඇති දේවල් ලෙස සැලකිය යුතුය.

අර්ථ නිරූපණ.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි,

"සමුපකාර සමිතිය" යන්නෙන් 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ දකුණු පළාත තුළ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් අදහස් වේ. එහෙත් මෙම ප්‍රඥප්තියේ දෙවන වගන්තිය යටතේ නියෝගයක් බලපවත්නේ යම් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් ද එම සමිතිය ඇතුළත් නොවේ.

"දිස්ත්‍රික්කය" යන්නෙන් දකුණු පළාත ඇතුළත යම් පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ.

"සේවකයා" යන්නෙන් යම් සමුපකාර සමිතියක් සේවයේ යොදවනු ලබන සහ එම සමුපකාර සමිතිය විසින් වැටුප් හා පාරිශ්‍රමික එහි අරමුදලින් ගෙවනු ලබන යම් පුද්ගලයෙක් අදහස් වේ. එහෙත් එයට නිලධාරියෙක් ඇතුළත් නොවේ.

"සේවා යෝජකයා" යන්නෙන් එහි සේවකයන්ට එහි අරමුදලෙන් වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ගෙවනු ලබන යම් සමුපකාර සමිතියක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ සමුපකාර සංවර්ධන විෂය පවරා ඇති පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

"සමිති නිලධාරියා" යන්නට සමුපකාර සමිතියක මහ සභාවක් විසින් පත්කර ගත් සභාපති, උපසභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන සියලු පුද්ගලයින් ඇතුළත් වේ.

"නියමිත" යන්නෙන් රෙගුලාසිවලින් නියම කරන ලද යන්න අදහස් වේ.

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වේ.

"පළාත් කොමසාරිස්වරයා" යන්නෙන් 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 වන වගන්තිය යටතේ දකුණු පළාතට පත්කරන ලද පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් / සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා යන්න අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) වගන්තිය යටතේ පිහිටුවන ලද දකුණු පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

44. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**(14 වන වගන්තිය) උපලේඛනය**

*කොමිෂන් සභාවේ සාමාජිකයාගේ ප්‍රතිඥාව*

සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයෙකු ලෙස පත්කරනු ලැබ සිටින ........................................................................ වන මම, සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධුරයෙහි කාර්යයන් භයක් හෝ පක්ෂ භජනයක් හෝ දයාවක් හෝ ද්වේශයක් නොමැතිව ඉටු කරන බව හා ඒ කාර්යයන්ට අදළ කිසිදු කරුණක් මට අයත් රාජකාරි ඉටුකිරීමෙහි ලා හැර, අන් ලෙසකින් කිසිදු තැනැත්තෙකුට නියමින් හෝ අනියමින් එළිදරව් නොකරන බවට ගාම්භීරතා පූර්වකවද, අවංකවද, දිවුරුම් දෙමි/ප්‍රතිඥා දෙමි.

20........ ක් වූ ............. මස ........... වැනි දින

.....................................................
දිවුරුම්/ප්‍රතිඥා දෙන්නාගේ අත්සන.

20................. මස ........... වැනි දින වූ මෙදින මා ඉදිරිපිට දී දිවුරන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

.....................................................
පළාත්බද මහාධිකරණයේ විනිශ්චයකාර.

04 - 892

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.